# ජාතික ලුණු සමාගම

## මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ජාතික ලුණු සමාගම, මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ විෂය සීමාව යටතේ වන රජය සතු සමාගමකි. කොළඹ ප්‍රධාන කාර්යාලය සහ මන්නාරම හා අලිමංකඩ (කිලිනොච්චිය) ලුණු ලේවායන්හි ස්ථිර පදනම මත සේවය කිරීමට පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

## කළමනාකරු - ලුණු ලේවාය (MM 1-1)
## ස්ථිර පදනම මත
## (අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් විද්‍යාව හෝ ඉංජිනේරු විද්‍යාව පිළිබඳ උපාධියක් සහ ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ පිළිගත් ආයතනයක ලුණු ලේවායක හෝ තනතුරට අදාළ වෙනත් යම් කර්මාන්තයක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**හෝ**

2. තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ / වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් 7 මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම සමග ලුණු ලේවායක හෝ තනතුරට අදාළ ව්‍යාපෘතියක අවම වශයෙන් වසර එකක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර සුදුසුකම් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය අවකාශයේ කනිෂ්ඨ කළමනාකරු (JM) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය**

MM 1-1-2016 - (මූලික වැටුප - රු. 53,175 - වැටුප් වර්ධක - 10X1,375-15X1,910-95,575) සහ ජීවන වියදම් දීමනාව රු. 17,800/= විශේෂ දීමනාව රු. 5,000/=, වෘත්තීය දීමනාව රු. 3,000/=, දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## කළමනාකරු - මුදල් (MM 1-1)
## ස්ථිර පදනම මත
## (කොළඹ ප්‍රධාන කාර්යාලය - තනතුරු 01)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

1. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය හෝ වාණිජ්‍යය පිළිබඳ උපාධියක් සමග ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු රජයේ හෝ ඕනෑම පිළිගත් ආයතනයක මූල්‍ය කළමනාකරු හෝ ගණකාධිකාරී තනතුරක අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද .

**හෝ**

2. ICASL, CIMA අන්තර් මධ්‍යම මට්ටම සමත්වීම සමග රාජ්‍ය සංවිධානයක හෝ ඕනෑම පිළිගත් ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර එකක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.

**අභ්‍යන්තර සුදුසුකම් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. තනතුරට අදාළ විෂය අවකාශයේ කනිෂ්ඨ කළමනාකරු (JM) ප්‍රභේදයේ තනතුරක අවම වශයෙන් වර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය**

MM 1-1-2016 - (මූලික වැටුප රු. 53,175 - වැටුප් වර්ධක - 10X1,375-15X1,910-95,575) සහ ජීවන වියදම් දීමනාව රු. 17,800/=, විශේෂ දීමනාව රු. 5,000/=, වෘත්තීය දීමනාව රු. 3,000/=, දුරකථන දීමනාව රු. 2,000/= සහ රජයේ අනුමත අනෙකුත් දීමනාද ගෙවනු ලැබේ.

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

## යාන්ත්‍රික ශිල්පී (PL-3)
## ස්ථිර පදනම මත
## (මන්නාරම ලුණු ලේවාය - තනතුරු 01)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

**වෘත්තීය**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ/ වෘත්තීය අභ්‍යාස ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් හතර (04) මට්ටමට නොඅඩු තනතුරෙහි ක්‍රියාකාරකම්වලට අදාළ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කළ ජාතික වෘත්තීය සුදුසුකම් දෙක (02) මට්ටම නොඅඩු නිපුණතා සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) ක්‍රියාකාරී පළපුරුද්ද සම්පූර්ණ කර ඇති ප්‍රාථමික මට්ටම අර්ධ පුහුණු (PL2) හෝ නුපුහුණු (PL1) සේවකයින් වීම.

**වැටුප් පරිමාණය**

PL3 -2016 (මූලික වැටුප රු. 26,290 - වැටුප් වර්ධක - 10X270-10X330-12X350-39,490) සහ ජීවන වියදම් දීමනාව රු. 17,800/=, විශේෂ දීමනාව රු. 5,000/=, වැනි රජයේ අනුමත අනෙකුත් දීමනා.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

## විදුලි ශිල්පී (PL-3)
## ස්ථිර පදනම මත
## (අලිමංකඩ ලුණු ලේවාය - තනතුරු 01)

**අවශ්‍ය සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

**වෘත්තීය :**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව පිළිගත් තාක්ෂණ/ වෘත්තීය ආයතනයකින් නිකුත් කළ ජාතික වෘත්තීය සුදුසුකම් හතර (04) මට්ටමට නොඅඩු තනතුරෙහි ක්‍රියාකාරකම්වලට අදාළ නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

1. ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.

**හෝ**

2. වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කළ ජාතික වෘත්තීය සුදුසුකම් දෙක (02) මට්ටමට නොඅඩු නිපුණතා සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) ක්‍රියාකාරී පළපුරුද්ද සම්පූර්ණ කර ඇති ප්‍රාථමික මට්ටම අර්ධ පුහුණු (PL2) හෝ නුපුහුණු (PL1) සේවකයින් වීම.

**වැටුප් පරිමාණය**

PL3-2016 (මූලික වැටුප රු. 26,290 - වැටුප් වර්ධක - 10X270-10X330-12X350-39,490) සහ ජීවන වියදම් දීමනාව රු. 17,800/= හා විශේෂ දීමනාව රු. 5,000/= වැනි රජයේ අනුමත අනෙකුත් දීමනා.

**වයස :** අවුරුදු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්ට අදාළ නොවේ.

**වෙනත් :** සෑම අයදුම්කරුවෙකුම;

i. ශ්‍රී ලාංකික පුරවැසියකු විය යුතුය.

ii. තනතුරෙහි රාජකාරී මැනැවින් ඉටුකිරීම සඳහා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට කායිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.

iii. විශිෂ්ඨ චරිතයකින් හෙබි විය යුතුය.

කරුණාකර ඔබේ ජීව දත්ත සහතික පිටපත් සමග 2024.07.29 දින හෝ ඊට පෙර පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කරන්න.


**සාමාන්‍යාධිකාරී,**

**ජාතික ලුණු සමාගම,**

**නො. 561/3, ඇල්විටිගල මාවත, කොළඹ 05.**

**දුරකථනය : 011-2368974**


ලිපි කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.